**ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය - 2017**

---

ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමණාකරන ආයතනයේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ මෙහෙයුම් කටයුතු පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සමග සංයෝජිතව කියවියයුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. මුදල් පනතේ 13(6) වගන්තිය ප්‍රකාර ඉදිරිපත් කළ යුතු 2017 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 ඔක්තෝබර් 31 දින වන විටත් ඉදිරිපත්කර නොතිබුණි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළයුතු යැයි අදහස්කරන සමාලෝචිත වර්ෂයේ ආයතනයේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණ මෙම වාර්තාවට ඇතුළත් වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

---

ආයතනයේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

---

**2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

---

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසාන වී දින 60 ක් ඇතුලත මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතු වුවත්, 2016 සහ 2017 වර්ෂවල මූල්‍ය ප්‍රකාශන 2018 ඔක්තෝබර් 31 දින වන විටත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

**2.2 වත්කම් හා වගකීම් වල පැවැත්ම**

---

ආයතනය විසින් අවසන් වරට පිළියෙල කරන ලද 2015 දෙසැම්බර් 31 දිනට වූ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වත්කම්, බැරකම්, ආදායම් හා වියදම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| **මූල්‍ය ප්‍රකාශන අයිතමය** | **වටිනාකම** |
|---|---|
| **වත්කම්** | |
| | **රු.** |
| ජංගම නොවන වත්කම් | 619,925,910 |
| ජංගම වත්කම් | 402,380,412 |
| මුළු වත්කම් | 1,022,306,322 |

| | |
|---|---|
| බැරකම් | |
| --------- | |
| ජංගම බැරකම් | 105,623,092 |
| ශුද්ධ වත්කම්/අයිතිය | 916,683,230 |
| | ----------------- |
| මුළු බැරකම් | 1,022,306,322 |
| | ========== |
| මුළු ආදායම් | 441,675,374 |
| මුළු වියදම් | (331,289,989) |
| | ------------------ |
| අතිරික්තය | 110,385,385 |
| | =========== |

## 2.3 නීති රීති,රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

-----------------------------------------------------------------------

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති,රීති,රෙගුලාසි සහ කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) | 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ 39,(2),(3) උපවගන්ති | ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයක් පත්කර නොතිබුණි. |
| (ආ) | 1999 සංචාරක හෝටල් ව්‍යවස්ථා සංග්‍රහයේ අංක 02 වගන්තිය | සංචාරක හෝටලයක් පවත්වාගෙන යාමේ දී ව්‍යාපාරය ලියාපදිංචි කර ඒ සඳහා බලපත්‍රයක් ලබාගත යුතු වුවද ආයතනයෙන් පාලනය වන සමුද්‍රා හෝටලය සඳහා ලියාපදිංචිය හා බලපත්‍ර ලබාගෙන නොතිබුණි. |
| (ඇ) | 2008 ජනවාරි 01 දිනැති අංක 1530/13 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයෙන් සංශෝධිත 2006 අංක 12 දරන මුද්දර බදු පනතේ 03 වන වගන්තිය | ගෙවීම් කිරීමේදී රු.25,000 කට වැඩි සෑම ගෙවීමකින්ම රු.25 ක මුද්දර බද්දක් රජය වෙනුවෙන් අය කර ගත යුතු වුවද, ආයතනය එසේ කටයුතු කර නොතිබුණු අවස්ථා නිරීක්ෂණය විය. |
| (ඈ) | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛය | ස්ථාවර වත්කම් ලේඛණයක් පවත්වා ගත යුතු වුවද, ඊට අනුකූලව කටයුතු කර නොතිබුණි. |
| (ඉ) | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයි.ඒ.අයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිගණක දෘඩාංග සහ මෘදුකාංග සඳහා ලේඛනයක් පවත්වා ගත යුතු වුවද, ඊට අනුකූලව කටයුතු කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ඊ) | 2003 ජුනි 02 දිනැති පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 4.2.5 වගන්තිය | කාරක ප්‍රාග්ධනය කාර්යක්ෂමව කළමනාකරණය කර ගැනීම පිණිස ණයගැති,ණයහිමි කාල විශ්ලේෂණය, තොග කාල විශ්ලේෂණය පැරණි යල්පැනගිය හා සෙමින් චලනය වන තොග සහ වෙනත් අයිතම පිළිබඳ ප්‍රකාශය යන ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මාසිකව සමාලෝචනය කළ යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (උ) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය**<br>------------------------------------------ | |
| | (i) මුදල් රෙගුලාසි 104 (3) හා 104 (4) | 2017 වර්ෂයේ සිදුවී තිබූ වාහන අනතුරු 02 ක් සම්බන්ධයෙන් දින 07 ක් ඇතුලත ඉදිරිපත් කල යුතු මූලික පරීක්ෂණ වාර්තාව හෝ මාස 03 ක් ඇතුලත ඉදිරිපත් කල යුතු අවසාන පරීක්ෂණ වාර්තාව විගණන අවස්ථාව වූ 2018 ජූලි 31 දින වනවිටත් ඉදිරිපත් කර නොතිබුණි. |
| | (ii) මුදල් රෙගුලාසි 371(2)(ආ) | ගණන්දීමේ නිලධාරියකු විසින් අතුරු අග්‍රිමයක් දිය යුත්තේ කිසියම් විශේෂිත කාර්යයක් සඳහා එක් අවස්ථාවකදී රු.100,000 ක උපරිමයක් දක්වා පමණක් වුවද, ඊට පටහැනිව අත්තිකාරම් ලෙස එක් අවස්ථාවකදී රු.150,000ක් ලබාදී තිබුණි. තත්කාර්ය අතුරු අග්‍රිමය ලබාදිය හැක්කේ මාණ්ඩලික තත්ත්වයේ නිලධාරීන්ට පමණක් වුවද, ආයතනයේ කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් නිලධාරීන්ට අවස්ථා 02 කදී එකතුව රු. 17,500 ක් වූ අත්තිකාරම් ලබාදී තිබුණි. |
| | (iii) මුදල් රෙගුලාසි 371(5) | තත්කාර්යය අතුරු අග්‍රිමය අදාල විශේෂිත කාර්යයට ආසන්නතම දිනයකදී නිලධාරියා වෙත ලබාදියයුතු අතර නිලධාරියා විසින් එම කාර්යය අවසන් කර දින 10 ක් ඇතුලත නැවත අග්‍රිමය පියවිය යුතුය. එසේ වුවද, අවස්ථා 33 කදී ලබා දී තිබුණු රු. 4,000 සිට රු. 90,000 දක්වා වූ තත්කාර්යය අතුරු අග්‍රිම පියවීම සඳහා දින 26 සිට දින 302 ක් දක්වා වූ කාලපරාසයක් ගතකර තිබුණි.<br><br>එසේම අත්තිකාරම් ගෙවීමේදී එම අත්තිකාරම් මුදල ලබාගත් මුදල් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වැඩියෙන් ප්‍රමාද නොකර නැවත පියවියයුතු වුවත්, අවස්ථා 02 කදී ලබා දුන් එකතුව රු. 35,000 ක් වූ අත්තිකාරම් සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි. |
| | (iv) මුදල් රෙගුලාසි 756 | සමාලෝචිත වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණය සිදු කර ඇතත් ඊට අදාළ වාර්තා විගණන අවස්ථාව වූ 2018 අගෝස්තු 31 දින දක්වාම විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි. |

(v) මුදල් රෙගුලාසි 1642

වාහන භාවිතා කරන නිලධාරීන් විසින් හෝ ඔවුන් නොමැති අවස්ථාවලදී ඒ වාහන භාර රියදුරන් විසින් හෝ සිදුවන සියලු හදිසි අනතුරු ළගම ඇති පොලීසියට වාර්තා කර පොලිස් වාර්තාවක් ලබාගත යුතු වුවද, 2017 ජූනි 06 දින වාහනයකට සිදුවූ හදිසි අනතුර සම්බන්ධව එසේ කටයුතු කර නොතිබුණි.

(vi) මුදල් රෙගුලාසි 1646

වාහන භාර නිලධාරීන් විසින් ඊළඟ මාසයේ 15 දින ගතවීමට ප්‍රථම 268 (අ) වැනි ආකෘති පත්‍රයෙහි ලියන ලද ගමන් පිළිබඳ මාසික සාරාංශයේ මුල් පිටපතද සමඟ ඒ ඒ මාසයේ දෛනික ධාවන සටහන් විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතු වුවත් ආයතනයේ වාහන 05 කට අදාලව එකී උපදෙස් අනුව කටයුතු කර නොතිබුණි.

(vii) මුදල් රෙගුලාසි. 1647 (ඉ)

වාහන භාර නිලධාරීන් විසින් තමා භාරයේ ඇති මෝටර් වාහන වර්ගය, මෝස්තරය, ලියාපදිංචි අංකය පිළිබඳ තොරතුරු ඇතුලත් කර මෝටර් වාහන ලැයිස්තුවක් පවත්වාගෙන යායුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

## 2.4 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

-----------------------------------------------------------------

2014 මැයි 06 දිනැති අංක 2014/55/09 දරන අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය අනුව, බාහිර කථිකාචාර්යවරුන්ට ඔවුන්ගේ සුදුසුකම් හා පළපුරුද්ද මත පැයකට ගෙවන ලද දීමනාව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියෙන් තොරව සංශෝධනය කර තිබුණු අතර 2017 ජනවාරි සිට ජූනි මාසය දක්වා සංශෝධිත ගාස්තු අනුව බාහිර කථිකාචාර්ය දීමනා වශයෙන් රු.662,750 ක් වැඩිපුර ගෙවා තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

--------------------------

## 3.1 කාර්යසාධනය

--------------------

### 3.1.1 සැළසුම් කිරීම

-----------------

ආයතනයේ 2016-2018 සංයුක්ත සැලැස්ම, 2017 ක්‍රියාකාරී සැලැස්ම හා 2017 කාර්යයසාධන වාර්තාව සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) ආයතනයේ 2017 ක්‍රියාකාරී සැලැස්ම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගෙන නොතිබුණි.

(ආ) ආයතනයේ ක්‍රියාකාරී සැලැස්මට අනුගත වන පරිදි සමාලෝචිත වර්ෂය සඳහා වූ කාර්යයසාධන වාර්තාව සකස් කර නොතිබුණි. එබැවින් ආයතනයේ කාර්යයසාධනය ඇගයීමේ ඵලදායී කාරකයක් ලෙස ක්‍රියාකාරී සැලැස්ම යොදා ගත නොහැකි වී තිබුණි.

(ඇ) 2016-2018 වර්ෂයන් සඳහා වූ සංයුක්ත සැලැස්මක් සකස් කර තිබුණද, ආයතනයේ අරමුණු ඉටුකර ගැනීම සඳහා පවතින ශක්තීන් හා දුර්වලතා මෙන්ම අවස්ථා හා බාධකයන්ද මනා ඇගයීමකට ලක් කර සැලසුම් කටයුතු කර නොතිබුණි.

(ඈ) වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සමඟ ඉදිරිපත් කළ යුතු මානව සම්පත් සංවර්ධන සැලැස්ම සකස් කර නොතිබුණි.

**3.2 කළමනාකරණ ක්‍රියාකාරකම්**

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමුද්‍රා හෝටලයේ උත්සව ශාලාව වෙන්කිරීම පසුව අවලංගු කිරීමේදී ආයතනයට වන අලාභය සම්බන්ධයෙන් අත්තිකාරම් මුදලින් රඳවා ගත යුතු ප්‍රතිශතයන් පිළිබඳ විධිවිධාන සලසා නොතිබුණි.

(ආ) සමුද්‍රා පුහුණු හෝටලයේ කාමර අංක 202 හි , 2016 මැයි 25 දින සිට 2017 අගෝස්තු 17 දින දක්වා බාහිර පාර්ශවයක් විසින් නවාතැන් ගෙන සිටි අතර නවාතැන් ගාස්තු වශයෙන් අයවිය යුතු රු. 4,050,000 ක මුදල විගණන අවස්ථාව වූ 2018 ඔක්තෝබර් 31 දින වන විටත් අයකරගෙන නොතිබුණි. නවාතැන් පහසුකම් ලබා දීමේදී කළමනාකරණය විසින් කිසිදු අත්තිකාරම් මුදලක් හෝ ලිඛිත ගිවිසුමක් අත්සන් කිරීමකින් තොරව ලබා දී ඇති බව තවදුරටත් නිරීක්ෂණය විය.

(ඇ) ආයතනය මගින් පවත්වන ලද පාඨමාලා වෙනුවෙන් අය කරනු ලබන ගාස්තු 2006අප්‍රේල් මාසයෙන් පසු සංශෝධනය කර නොතිබුණි.

(ඈ) අපේක්ෂිත වියදම වඩාත් නිවැරදිව ඇස්තමේන්තු නොකිරීම හේතුවෙන් අවශ්‍ය ප්‍රමාණයට වඩා සියයට 45 සිට සියයට 90 දක්වා අතිරික්ත මුදල් ප්‍රමාණයක් අත්තිකාරම් වශයෙන් ලබාදී තිබුණු අතර ඒ අනුව කාර්යය අවසන් වූ වහාම ඉතිරි මුදල් නොපියවා දින 26 සිට දින 213 ක් දක්වා අතිරික්ත මුදල් අත්තිකාරම් ලබාගත් නිලධාරියා අත රඳවාගෙන සිටීම මත රජයේ මුදල් අනිසි ලෙස භාවිත කිරීම වැළැක්වීම සම්බන්ධයෙන් කළමනාකරණයේ අවධානය යොමුවී නොතිබුණි.

(ඉ) ආයතනය විසින් අනාගත විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් පියවීමේ අරමුණින් 2013 ඔක්තෝබර් 30 දින සාමාන්‍ය ඉතිරිකිරීමේ ගිණුමක රු.11,910,882 ක මුදලක් ආයෝජනය කර සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම පවත්වාගෙන ගොස් තිබුණි. එම මුදල වඩාත් ඵලදායී ප්‍රතිලාභ ලබා ගත හැකි පරිදි ස්ථාවර තැන්පතුවක ආයෝජනය කිරීමෙන් ලැබිය හැකිව තිබුණු පොලී ආදායම ආයතනයට අහිමි වී තිබුණි.

(ඊ) 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ 10, 16 හා 47 වගන්තිවලට පටහැනිව සේවකයාගේ හා සේව්‍යයාගේ දායකය ගෙවීම් කිරීමේදී ගැලපිය යුතු දීමනා හැර මූලික වැටුප පමණක් පදනම් කරගෙන ගෙවීම් කිරීම නිසා 2008 අගෝස්තු මාසයේ සිට 2014 දෙසැම්බර් මාසය දක්වා කාලසීමාව වෙනුවෙන් සේවකයාගේ දායකය ලෙස රු.35,210 ක් හා ඊට අදාල අධිභාර මුදල ලෙස රු.44,013ක් වශයෙන් එකතුව රු.79,223 ක මුදලක් අතිරේකව ආයතනයට දැරීමට සිදුවී තිබුණි.

**3.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්**

--------------------------

සමුද්‍රා හෝටලයේ වර්ෂය තුල ආදායම් ලබාගැනීම සඳහා හෝටල් කාමර රාත්‍රී 3650ක් පවතින අතර එයින් ආයතනයට සමාලෝචිත වර්ෂය තුළ ලබාදිය හැකිව තිබුණේ හෝටල් කාමර රාත්‍රී 845ක් හෙවත් සියයට 23 ක් පමණි. තවද පසුගිය වර්ෂ කිහිපයක කාලය තුලදීම කාමර උපයෝජනයේ ප්‍රමාණවත් වර්ධනයක් සිදුවී නොමැති බව නිරීක්ෂණය වූ අතර එය 2014 වර්ෂය තුළ ලගාකරගෙන තිබුණු හෝටල් කාමර රාත්‍රී 1442 හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂය වනවිට හොටල් කාමර රාත්‍රී 845 ක් දක්වා සියයට 41 කින් අඩු වී තිබුණි.

## 3.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරණු ලැබේ.

(අ) අමාත්‍යාංශයේ අමාත්‍ය කාර්යාලයක් තිබියදී හා අමාත්‍යවරයාගේ කාර්යාලයේ වියදම් වෙනුවෙන් අමාත්‍යාංශ වැය ශීර්ෂ යටතේ මුදල් වෙන්කර තිබියදී, 2016 වර්ෂයේ සිට ගිවිසුමකට එළඹීමකින් තොරව මෙම ආයතනයේ 7 වන මහල රේඛීය අමාත්‍යාංශයට ලබාදී තිබුණු අතර අමාත්‍යාංශයේ විදුලිය හා ජලය වෙනුවෙන් වූ ගෙවීම් ද ආයතනය විසින් දරා තිබුණි. ඊට අමතරව එහි පිහිටුවා තිබුණු අමාත්‍යවරයාගේ කාර්යාලයේ වැඩිදියුණු කිරීම් හා නඩත්තු කටයුතු වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුලදී ආයතනය විසින් රු. 2,449,004 ක මුදලක් වැය කර තිබුණි.

(ආ) ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන්ට පවරනලද රාජකාරි විස්තරය අනුව ප්‍රශ්ණපත්‍ර සැකසීම,ප්‍රශ්ණ පත්‍ර ඇගයීම, හා ශිෂ්‍යයන්ගේ කාර්යසාධනය ඇගයීම ඔවුන් විසින් සිදු කලයුතු වුවද වැටුපට අමතරව ඉහත රාජකාරි ඉටු කිරීම වෙනුවෙන් ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන්ට අතිරේක දීමනාවක් ගෙවමින් පැවතුණි. එලෙස 2017 වර්ෂය තුළ ගෙවා තිබුණු මුදල රු.183,390 ක් විය.

## 4. ගිණුම් කටයුතුභාවය සහ යහ පාලනය

## 4.1 ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

### 4.1.1 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2006 ජනවාරි 25 දිනැති ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 (ආ) ඡේදය ප්‍රකාරව ආයතනය සඳහා තුන් අවුරුදු ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබීම 2017 වර්ෂය වෙනුවෙන් සකස් කර තිබුණු ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මට ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගෙන නොතිබීම සහ සියළුම ප්‍රසම්පාදනයන්හි ආරම්භක දිනය 2017 ජනවාරි 01 ලෙස යොදා තිබීම වැනි හේතු නිසා ප්‍රසම්පාදන සැලැස්ම කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

(ආ) ආයතනය විසින් පවත්වාගෙන යන හෝටල් පාසලේ ශිෂ්‍යයන්ගේ ප්‍රායෝගික පුහුණු වැඩසටහන් සඳහා සහ සමුද්‍රා හෝටලයේ නවාතැන් ගන්නා අමුත්තන්ගේ සංග්‍රහ කටයුතු සඳහා අවශ්‍ය එළවළු, පළතුරු, මස්, මාළු හා වියලි ආහාර ද්‍රව්‍ය සැපයීම සඳහා 2014 වර්ෂයෙන් පසුව ප්‍රසම්පාදන කටයුතු සිදු නොකර 2014 වර්ෂයේදී තෝරාගත් සැපයුම්කරුවන්ගෙන්ම සමාලෝචිත වර්ෂය දක්වාම සැපයුම් ලබාගැනීම සිදුකර තිබුණි. එලෙස සමාලෝචිත වර්ෂය තුල ලබාගෙන තිබූ සැපයුම්වල වටිනාකම රු.7,296,505 ක් විය.

(ඇ) 2017 වර්ෂය ආරම්භයේදී සිදුකල ප්‍රසම්පාදන ක්‍රියාවලිය 2017 දෙසැම්බර් 26 දින අවසන් කර ප්‍රසම්පාදනය ප්‍රදානය කිරීමේ ලිපි නිකුත් කර තිබුණද, විගණිත දිනය වූ 2018 ජූලි 31 දිනය දක්වාම ආයතනය මේ සම්බන්ධයෙන් ලිඛිත ගිවිසුම්වලට එළඹ නොතිබුණි. ඉහත කාලපර්ච්ඡේදය තුල ගිවිසුම්වලට එළඹීමකින් තොරව හෝටල් පාසලේ ශිෂ්‍යයන්ගේ ප්‍රායෝගික පුහුණු වැඩසටහන් සහ සමුද්‍රා හෝටලයේ නවාතැන් ගන්නා අමුත්තන්ගේ සංග්‍රහ කටයුතු සඳහා අවශ්‍ය එළවළු, පළතුරු, මස්, මාළු හා වියලි ආහාර ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා වැය කර තිබුණු මුළු මුදල රු.15,154,700 ක් විය.

(ඈ) 2017 වර්ෂයේ සිදුකල ප්‍රසම්පාදන ක්‍රියාවලිය සම්බන්ධයෙන් පහත අඩුපාඩු පැවතුණි.

(i) ප්‍රසම්පාදනයේදී ඇගයීමට භාවිතා කරනු ලබන උපමාන දක්වා නොතිබූ අතර කිසිදු සැපයුම්කරුවෙකු ලංසු සුරක්ෂණ ඉදිරිපත් කර නොතිබීම.

(ii) මිල ගණන් විවෘත කිරීමේදී මුද්‍රා තැබූ ලිපි කවරයේ සහ ඉදිරිපත් කල ලංසු ලේඛනවල විවෘත කල දිනයේ දින මුද්‍රාව යොදා කමිටු සාමාජිකයන් තිදෙනාම අත්සන් කර නොතිබීම.

(iii) මිල විවෘත කිරීමේ අවස්ථාවට මිල කැඳවීම් සඳහා ප්‍රතිචාර දැක්වූ සැපයුම්කරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් සහභාගී වූ බවට සාක්ෂි නොවීම.

**4.2 වාර්ෂික වාර්තා සභාගත කිරීම**

ආයතනය විසින් 2012 වර්ෂයට අයත් වාර්ෂික වාර්තා 2014 සැප්තැම්බර් 09 දින පාර්ලිමේන්තුවේ සභාගත කර තිබුණු අතර ඉන්පසු වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

**5. පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර ආයතනයේ සභාපතිගේ අවධානයට යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍රය | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් | ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කර නොතිබීම. |
| (ආ) | ප්‍රසම්පාදන ක්‍රියාවලිය | හෝටල් පාසලේ ශිෂ්‍යයන්ගේ ප්‍රායෝගික පුහුණු වැඩසටහන් සහ සමුද්‍රා හෝටලයේ නවාතැන් ගන්නා අමුත්තන්ගේ සංග්‍රහ කටයුතු සඳහා අවශ්‍ය එළවළු, පළතුරු, මස්, මාළු හා වියලි ආහාර ද්‍රව්‍ය සැපයීම සඳහා වූ ප්‍රසම්පාදන ක්‍රියාවලිය විධිමත් පරිදි සිදුකර නොතිබීම. |
| (ඇ) | වාහන පරිපාලනය | ඇතැම් වාහන වල නීත්‍යානුකූල හිමිකාරීත්වය ආයතනය නමින් පවරා ගැනීමට කටයුතු කර නොතිබීම. |
| (ඈ) | බාහිර කථිකාචාර්ය දීමනා | බාහිර කතිකාචාර්යවරුන්ගේ දීමනා අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතියෙන් තොරව සංශෝධනය කර තිබීම. |
| (ඉ) | ඉන්වෙන්ට්‍රි පාලනය | (i) එක් එක් අංශ සඳහා ඉන්වෙන්ට්‍රි ලේඛන නොපවත්වන අතර භාණ්ඩ සමීක්ෂණ වාර්තාද පිළියෙල කර නොතිබීම.<br>(ii) භාවිතයට ගත නොහැකි වත්කම් සම්බන්ධයෙන් විධිමත් ක්‍රමවේදයක් සකස් කර නොතිබීම. |
| (ඊ) | ලේඛන පවත්වාගැනීම | අත්තිකාරම් ලේඛන යාවත්කාලීනව පවත්වා නොතිබීම. |
| (උ) | කාර්ය මණ්ඩල පරිපාලනය | i. මානව සම්පත් සැලැස්මක් සකස් කර නොතිබීම. |

ii. විධිමත් මාරුකිරීමේ පටිපාටියක් නොපැවතීම.

iii. වාර්ෂික කාර්යසාධන ඇගයීම සඳහා සකස් කල වැඩසටහනක් නොපැවතීම.

iv. මානව සම්පත් තොරතුරු පද්ධතියක් පවත්වා නොගැනීම.

(ඍ) සැලසුම් කිරීම

ආයතනය විසින් 2017 වර්ෂය තුල සැළසුම් කරන ලද පාඨමාලා සඳහා ඉලක්කගත ශිෂ්‍ය සංඛ්‍යාව සම්බන්ධයෙන් ලේඛකාධිකාරී විසින් විගණනය වෙත සපයන ලද සංඛ්‍යා හා ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුළත් සංඛ්‍යා අතර වෙනස්කම් පැවතීම.